# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | විදේශ විනිමය දෙපාර්තමේන්තුව |
| දිනය | 2021 පෙබරවාරි 19 |

## අපනයනය මඟින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීම

2021 පෙබරවාරි මස 18 වන දිනැති අංක 2215/39 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබ ඇති පරිදි, අපනයනය මඟින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ලැබීම හා එකී මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමට අදාළ රීතීන්, මුදල් මණ්ඩලය මඟින් නිකුත් කර ඇත.

ඒ අනුව, නැවත දැනුම් දෙන තුරු, පහත රීතීන් 2021 පෙබරවාරි මස 18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පනවා ඇත.

1. සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම, නැවත දැනුම් දෙන තුරු :

   (i) අපනයනය කරන ලද සියලු භාණ්ඩවලට අදාළව අපනයනය කිරීමෙන් ලද මුදල්, භාණ්ඩ නැව්ගත කරන ලද දිනයේ සිට දින එකසිය අසූවක් (180) ඇතුළත ශ්‍රී ලංකාව වෙත ගෙන්විය යුතුය, සහ

   (ii) සෑම අපනයනයක් සඳහාම ලද සියලු මුදල් ලැබීම්වලට අදාළ සියලු ලේඛනගත සාක්ෂි, එම මුදල් ලබන්නාවූ බලපත්‍රලාභී වාණිජ බැංකුවට හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවට (මෙහි මින්මතු “බලපත්‍රලාභී බැංකුව” වශයෙන් හඳුන්වනු ලබන) නොපමාව ඉදිරිපත් කළ යුතුය.

2. සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම, මෙම රීතිය යටතේ ඉල්ලා ඇති පරිදි අපනයනය මගින් ලද මුදල් ලැබුණු වහාම, බලපත්‍රලාභී බැංකුවක් මගින් එකී අපනයනය මගින් ලද මුළු මුදලින් සියයට විසි පහක ප්‍රතිශතයක් (25%) ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතුය.

3. ඉහත සඳහන් කරන ලද අපනයනය කිරීම මගින් ලද මුදල් සියයට විසි පහක (25%) ප්‍රතිශතයකින් පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවය, මුදල් මණ්ඩලය මගින් කලින් කලට යම් වෙනත් ප්‍රතිශතයක් නියම කරනු ලබන තෙක් අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය.

4. සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම මෙම රීතියෙන් නියම කරන ලද කාලය තුළ අපනයන කිරීම මගින් ලද මුදල් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සහ මෙම රීතියෙන් නියම කර ඇති පරිදි එම මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අනිවාර්යයෙන්ම අධීක්ෂණය කළ යුතු අතර, ඒ සඳහා අදාළවන හෝ ඒ හා බැඳෙන සියලු ලිඛිත සාක්ෂි පවත්වාගෙන යා යුතුය.

5. සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම කලින් කලට නියම කරනු ලබන පරිදි වාර්තා, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති හෝ නියෝජ්‍ය අධිපති විසින් බලය දෙනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්හට මෙම රීතිය යටතේ පවත්වාගෙන යනු ලබන වාර්තා පරීක්ෂා කිරීම සහ එකී බලපත්‍රලාභී බැංකු විසින් මෙම රීතීන් විෂයෙහි අනුකූලතාවය තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පරීක්ෂා කිරීම හා සමාලෝචනය කිරීම සඳහා බාධාවකින් තොරවූ ප්‍රවේශයක් ලබා දිය යුතුය.

6. මෙකී රීති, අපනයනය කරන ලද සියලු භාණ්ඩ සඳහා සහ භාණ්ඩ නැව් ගත කරන ලද දිනයේ සිට එකසිය අසූව (180) වන දිනය 2021 පෙබරවාරි 18 වන දිනට පසු ඕනෑම දිනයක එළැඹෙන්නේ වී නම්, අදාළ විය යුතුය.

7. මෙම රීති, 2021 පෙබරවාරි 18 වන දිනයේ සිට වහාම ක්‍රියාත්මක වන පරිදි බලපැවැත්වේ.

8. සැක දුරුකර ගැනීම පිණිස හා මෙකී රීතිවල කාර්යය සඳහා "අපනයනය මගින් ලද මුදල්" යන්නට, 2019.10.17 දිනැති අංක 2145/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද රෙගුලාසි ප්‍රකාරව ශ්‍රී ලංකාවට නැවත ගෙන්වා ගැනීමට අවශ්‍ය වන මුදල් ඇතුළත් වේ.